# ශ්‍රී ලංකාවේ ද්විතීය පාඨශාලාවල සමාජ විද්‍යා අධ්‍යයනයේ දී අධ්‍යාපනික සාධනය කෙරෙහි බලපාන සාධක විමර්ශනය කිරීම

අධ්‍යාපන ශාස්ත්‍රපති පරීක්ෂණයේ
අර්ධපූරණයක් වශයෙන්
පේරාදෙණිය විශ්වවිද්‍යාලයට
ඉදිරිපත් කෙරෙන
නිබන්ධනය යි.

355692

සී. ඉද්දමල්ගොඩ මහත්මිය
(බී.ඒ. (ලංකා), අධ්‍යාපන ඩිප්ලෝමා)

## සංක්ෂේපය

ශ්‍රී ලංකාවේ ද්විතීය පාඨශාලාවල සමාජ විද්‍යා විෂයයන් අධ්‍යයනයේදී ශිෂ්‍ය සාධනය කෙරෙහි බලපාන්නාවූ සාධක මොනවාදැයි විමර්ෂණය කිරීම හා එම සාධකවල සාපේක්ෂ වැදගත්කම විචලතා අනුපාතයක් වශයෙන් ගණනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. මේ සඳහා ශිෂ්‍ය සාධනය කෙරෙහි බලපාන සාධක සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින් විමර්ෂණය කිරීම වැදගත් විය. ඒ අනුව මෙම පර්යේෂණයේදී විෂය සාධනය කෙරෙහි සමාජ ආර්ථික තත්ත්වය, පාසැල, ආකල්ප සහ පාසැලින් හා නිවසින් බාහිර සාධක කෙතරම් දුරට වැදගත් වන්නේදැයි සමාජ විද්‍යා විෂයයන් ආශ්‍රයෙන් සාපේක්ෂ වශයෙන් ගණනය කරන ලදී. එම නිසා මෙම පර්යේෂණය ශිෂ්‍ය සාධනය කෙරෙහි පාසැලේ වැදගත්කම විමසන සමකාලීන පර්යේෂණ ගණයෙහිලා සැලකිය හැකිය ( Torney, Oppenheim, Farnen,I975, Hyneman I976, Brimer, Madows, Chapman, Kellazhan, Wood I978, Centra and Potter I98o).

මේ පරීක්ෂණයට මහනුවර දිස්ත්‍රික්කය තුළ පහසුකම් අතින් විවිධ මට්ටම්වල පවතින පාඨශාලා 18 ක් තෝරා ගන්නා ලදී. ඉන් පාසැල් 9ක් මහනුවර නගර සීමාවට අයත් වූ අතර අනෙක් පාසැල් 9 ය නගර සීමාවෙන් පිටත ඒවා විය. මෙම පාඨශාලා බාලිකා මහාවිද්‍යාල, බාලක මහාවිද්‍යාල, මිශ්‍ර මහාවිද්‍යාල හා කණිෂ්ඨ විද්‍යාල වශයෙන් විවිධ වර්ගයන්ට අයත් විය. මෙම පාඨශාලා වලින් සිසුන් 800 ක් පර්යේෂණයට ලක් විය. ඉන් 400 ක් ශිෂ්‍යයන් වූ අතර අනෙක් 400 ක් ශිෂ්‍යාවන් වූහ. විවිධ සමාජ ආර්ථික තත්ත්වයන්ට අයත් ස්ථිර නියැදියක් තෝරාගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු විය. ශිෂ්‍යයන් 200ක හා ශිෂ්‍යාවන් 200 ක, එනම් මුළු පිරිස 400 ක නියැදියකින් සොයාගත් තොරතුරු මෙම නිබන්ධනයේ ඉදිරිපත් කර තිබේ.

මෙම පරීක්ෂණයේදී ශිෂ්‍ය සාධනය ප්‍රධාන පරායත්ත විචල්‍යය වූ අතර ඒ කෙරෙහි බලපාන්නා වූ සාධක ප්‍රධාන ස්වායත්ත විචල්‍ය කාණ්ඩ 4ක් යටතේ අවධානයට ලක් විය. ඒවා ආකල්ප, සමාජ ආර්ථික තත්ත්වය, පාසැල, හා නිවසින් සහ පාසැලින් බාහිර සාධක යනාදියයි. මෙම ස්වායත්ත විචල්‍ය කාණ්ඩ 4 අනු විචල්‍ය 25 ක් යටතේ විමසුමට ලක්විය. මෙම පර්යේෂණ සඳහා අවශ්‍ය දත්ත එක්රැස් කිරීම සඳහා ආකල්පමය ප්‍රශ්නාවලි හා විස්තරාත්මක තොරතුරු ලබා ගන්නා ප්‍රශ්නාවලි ද සාධන පරීක්ෂණද, උපයෝගී කර ගන්නා ලදී.

මෙම පර්යේෂණයේ දත්ත විශ්ලේෂණය කිරීමේදී එක් එක් ස්වායත්ත විචල්‍යය හා ශිෂ්‍ය සාධනය අතර පවතින සම්බන්ධතාවය විමසුමට ලක්කල අතර ඒ එක් එක් ස්වායත්ත විචල්‍ය සාධක අතර පවතින අන්තර් සම්බන්ධතාවද ගණනය කරන ලදී. මේ අනුව පර්යේෂණයට ලක්වූ ස්වායත්ත විචල්‍ය සාධක 10 ක් හා සාධනය අතර සෑහෙන පමණ වෙසෙසි සම්බන්ධතාවයක් පවතින බවක් දක්නට ලැබුණි. තවද මේ ස්වායත්ත විචල්‍ය සාධක කාණ්ඩ වශයෙන් ගෙන සාධනය අතර පැවැති සම්බන්ධතාවය විමසීමේදී, පාසැලින් හා නිවසින් බාහිර විචල්‍ය සාධක කාණ්ඩය හැරෙන්නට ඉතිරි විචල්‍ය සාධක කාණ්ඩ හා සාධනය අතර වෙසෙසි සහසම්බන්ධතාවයක් පවතින බව දක්නට ලැබුණි. මේ අනුව වත්මන් පර්යේෂණයේදී උපකල්පිත කල්පිතයන් සනාථ විය. එහෙත් ඒ එකිනෙක කල්පිතයන්ගේ සාපේක්ෂ වැදගත්කම වෙනස්වන බව පෙනේ.

විශ්ලේෂණයට ලක්කරන ලද විචල්‍යයන් හා සාධනය අතර ඇති සාපේක්ෂ වැදගත්කම ගණනය කිරීමද මෙහිදී කරන ලදී. මුළු පර්යේෂණයෙන් අනාවරණය වූ තොරතුරු අනුව විස්තර වන විචලන ප්‍රමාණය( Explained Variance) වන 40.5% න් 62.3% ම විස්තර වූයේ සමාජ ආර්ථික තත්ත්වය යන

1982-10-15

සාධක යෙනි. පාසැල නම් විචල්‍ය සාධකය 24.76% ක් ද , ආකල්ප 10.7% ක්ද, නිවසින් හා පාසැලින් බාහිර සාධක 2.23% ක්ද විස්තර කරන බව පැහැදිලිවිය. මේ අනුව පර්යේෂණය සඳහා ඉදිරිපත් කළ කල්පිත සනාථ වූයේ අර්ධ වශයෙනි. ශ්‍රී ලංකාව ඌණ සංවර්ධිත රටක් වුවද ශිෂ්‍ය සාධනය කෙරෙහි වඩාත්ම බලපාන විචල්‍ය සාධකය වශයෙන් මෙහිදී අනාවරණය වී ඇත්තේ සමාජ ආර්ථික තත්ත්වයයි. මේ මගින් නොදියුණු රටවල් ආශ්‍රිතව කරන ලද වෙනත් පර්යේෂණ( Murphree I973, Mwaniki I973, Olson I975, Silvery I963 Heyneman I976 ) වල ප්‍රතිඵල වලට සමරූපී නොවන ප්‍රතිඵල මෙම පර්යේෂණයේදී ශ්‍රී ලංකාව ආශ්‍රිතව ලැබිය. එම රටවල සාපේක්ෂ වශයෙන් වැදගත්ම සාධකය වී ඇත්තේ සමාජ ආර්ථික තත්ත්වය නොව පාසැල වේ. මෙයට තුඩුදී ඇති හේතු සාකච්ඡාකර ඇත.

මෙම පර්යේෂණයෙන් ලත් ප්‍රතිඵල අනාගත ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නවීකරණයන් කිරීම කෙරෙහි ප්‍රයෝජනවත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.